# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2262/19 - 2022 ජනවාරි මස 11 වැනි අඟහරුවාදා - 2022.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ වන නියමය

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් 2019 දෙසැම්බර් මස 05 දිනැති අංක 2152/32 දරන අති *විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කළ නියමය,

I. එම නියමයේ I වැනි උපලේඛනයට, පහත I වැනි උපලේඛනයේ I හා II තීරුවල සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ IV වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති සහනදායී අනුපාත යටතේ III වැනි තීරුවේ සඳහන් වූ විස්තර යටතේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ඇතුළත් කිරීමෙන් ; සහ

II. එම නියමයේ III වැනි උපලේඛනයට, පහත II වැනි උපලේඛනයේ I හා II තීරුවල සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ IV වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති නිදහස් කිරීම් යටතේ III වැනි තීරුවේ සඳහන් වූ විස්තර යටතේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ඇතුළත් කිරීමෙන්,

සංශෝධනය කරමි.

මෙම නියෝගය 2022 ජනවාරි මස 12 වැනි දින සිට බලපැවැත්වේ.

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2022 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5717 - 510 (2022/01)

මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

### I වන උපලේඛනය

| *I*<br>*සං.ව. ශීර්ෂය* | *II*<br>*සං.ව. සංකේතය* | *III*<br>*විස්තරය* | *IV*<br>*සහනදායී අනුපාතය* |
|---|---|---|---|
| 84.81 | | **පීඩනය අඩු කිරීමේ කපාට සහ තාප පාලනාත්මකව පාලනය වන කපාට ඇතුළු පයිප්ප, බොයිලේරු කසු, ටැංකි, වැට් හෝ එවැනි දේ සඳහා අත්කරාම, කරාම, කපාට සහ සමාන උපයෝගී උපකරණ** | |
| | | | |
| | 8481.10 | පීඩනය අඩු කිරීමේ කපාට : | |
| | 8481.10.10 | ද්‍රව පෙට්‍රෝලියම් වායු සිලින්ඩර සමග භාවිතය සඳහා කපාට වැද්දුම් | 5% |
| | 8481.10.20 | ද්‍රව පෙට්‍රෝලියම් වායුව සඳහා පීඩන නියාමන උපකරණ සහ ස්වයංක්‍රීය මාරුවන උපාංග | 5% |
| | 8481.10.90 | අනෙකුත් | 5% |

### II වන උපලේඛනය

| *I*<br>*සං.ව. ශීර්ෂය* | *II*<br>*සං.ව. සංකේතය* | *III*<br>*විස්තරය* | *IV*<br>*නිදහස්* |
|---|---|---|---|
| **05.11** | | **අන්තැනක නිශ්චිත නොවූ හෝ ඇතුළත් නොවූ සත්ව නිෂ්පාදන : මනුෂ්‍ය ආහාරයට නුසුදුසු 1 වන හා 3 වන පරිච්ඡේදයේ මළ සතුන්** | |
| | | | |
| | 0511.99 | අනෙකුත් : | |
| | 0511.99.70 | කයිකෝරියස් රැමෝසස් බෙල්ලන්ගේ පිඩානය (නික්ලා හෝ මියුරෙක්ස් පිඩානය) | නිදහස් |
| | | | |
| **06.02** | | **අනෙකුත් සජීවී පැළෑටි (ඒවායේ මුල් ඇතුළුව), අතු කැබලි හා රිකිලි ; බිම්මල් බීජාණු** | |
| | | | |
| | 0602.20 | ආහාරයට සුදුසු පළතුරු හෝ ගෙඩි හටගන්නා බද්ධ කරන ලද හෝ නොකරන ලද ගස්, ලැහැබ් හා පඳුරු | |
| | 0602.20.10 | පටක රෝපණ කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුව 2වන හෝ 3 වන අවධිවල ඇති, එගාර් වැනි මාධ්‍යයක් සහිතව හෝ රහිතව පර්යේෂණාගාරයක් තුළ ප්‍රචාරණය කරන ලද පැළෑටි | නිදහස් |
| | 0602.20.90 | අනෙකුත් | |
| | 0602.30 | බද්ධ කරන ලද හෝ නොකරන ලද මහරත්මල් හා අසාලියා වර්ග (රොඩොඩෙන්ඩ්‍රන් සහ අසාලියා) | |
| | 0602.30.10 | පටක රෝපණ කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුව 2 වන හෝ 3 වන අවධිවල ඇති, එගාර් වැනි මාධ්‍යයක් සහිතව හෝ රහිතව පර්යේෂණාගාරයක් තුළ ප්‍රචාරණය කරන ලද පැළෑටි | නිදහස් |
| | 0602.30.90 | අනෙකුත් | නිදහස් |
| | 0602.40 | බද්ධ කරන ලද හෝ නොකරන ලද රෝස වර්ග | |
| | 0602.40.10 | පටක රෝපණ කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුව 2 වන හෝ 3 වන අවධිවල ඇති, එගාර් වැනි මාධ්‍යයක් සහිතව හෝ රහිතව පර්යේෂණාගාරයක් තුළ ප්‍රචාරණය කරන ලද පැළෑටි | නිදහස් |
| | 0602.40.90 | අනෙකුත් | නිදහස් |
| | 0602.90 | අනෙකුත් : | |

| I<br>සං.ව. ශීර්ෂය | II<br>සං.ව. සංකේතය | III<br>විස්තරය | IV<br>නිදහස් |
|---|---|---|---|
| | | තේ | |
| | 0602.90.11 | පටක රෝපණ කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුව 2 වන හෝ 3 වන අවධිවල ඇති, එගාර් වැනි මාධ්‍යයක් සහිතව හෝ රහිතව පර්යේෂණාගාරයක් තුළ ප්‍රචාරණය කරන ලද පැළෑටි | නිදහස් |
| | 0602.90.19 | අනෙකුත් | නිදහස් |
| | | ජලජ පැළෑටි | |
| | 0602.90.21 | පටක රෝපණ කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුව 2 වන හෝ 3 වන අවධිවල ඇති, එගාර් වැනි මාධ්‍යයක් සහිතව හෝ රහිතව පර්යේෂණාගාරයක් තුළ ප්‍රචාරණය කරන ලද පැළෑටි | නිදහස් |
| | 0602.90.29 | අනෙකුත් | නිදහස් |

EOG 01- 0197

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.